**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

*******

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>ශ්‍රී ලාංකික සහ ඉන්දියානු වෙළඳ ආයතන විසින් පශ්චාත් කොවිඩ් සමයේදී ද්විපාර්ශවික වෙළඳ සහ ආයෝජන ප්‍රවර්ධනය පිළිබඳ වීඩියෝ සමුළුවක්</u>**

**ඉන්දීය අපනයන සංවිධාන සංසදය (Federation of Indian Export Organisations -FIEO) ශ්‍රී ලංකා වාණිජ සහ කර්මාන්ත මණ්ඩලය (FCCISL) සහ කොළඹ වාණිජ මණ්ඩලය සමඟ පශ්චාත් කොවිඩ් සමය තුළ දෙරට අතර වෙළඳ සහ ආයෝජන අවස්ථාවන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා වීඩියෝ සමුළුවක් සංවිධානය කර තිබිණ. කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සහ නව දිල්ලියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන්ද මේ සඳහා සහභාගී වූහ.**

**2. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර වෙළඳ, ආයෝජන සහ සංචාරක ක්ෂේත්‍රයන්හි වර්ධනයේ වැදගත්කම අවධාරණය කරමින් FIEO, FCCISL සහ කොළඹ වාණිජ මණ්ඩල නියෝජිතයන් මෙම ක්ෂේත්‍රයන්හි සහයෝගීතාවය සඳහා නව මංපෙත් විවර කරගැනීම පිළිබඳව සාකච්ඡා කළෝය. අපනයන අභිමුඛ නිෂ්පාදන පිළිබඳව අවධානය යොමු කරමින්, FCCISL සහ කොළඹ වාණිජ මණ්ඩලය ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍රයන්හි ආයෝජනය සඳහා පවතින අවස්ථාවන් ද මෙහිදි ගෙනහැර දැක්වීය.**

**3. ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ තොරතුරු අංශයේ ප්‍රධානි නේහා සිංග් මෙනවිය කොවිඩ් 19 වසංගතය විසින් මතු කර ඇති අභියෝගයන් ජය ගැනීම සඳහා නව්‍ය ක්‍රමෝපායන් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දුන්නාය. ඉන්දීය සහ ශ්‍රී ලංකා රජයන් නිෂ්පාදනය පිළිබඳ ඉ-සහතික පිළිගැනීම ආදී ක්‍රමවේදයන් මඟින් වෙළඳ අංශය මුහුණ දී ඇති අභියෝගයන් ජයගැනීමට උපකාරී වන පියවර ගනිමින් සිටින බවද ඇය මෙහිදී සඳහන් කළාය. ඉන්දීය අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා ප්‍රකාශයට පත් කර ඇති ඇමරිකානු ඩොලර් බිලියන 265ක පැකේජය ඉල්ලුම නැංවීම තුළින් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර වෙළඳ කටයුතු නඟා සිටුවීමට ඉවහල් වන බව FCCISL සභාපතිතුමා ප්‍රකාශ කළේය.**

**4.** **මෙම වීඩියෝ සමුළුව ප්‍රශ්නෝත්තර සැසියකින් අවසන් වූ අතර කොළඹ වාණිජ මණ්ඩලය වෙළඳ විමසීම් සඳහා තත්‍ය කාලීනව ප්‍රතිචාර දැක්විය හැකි අන්තර්ජාලය පදනම් කරගත් යාන්ත්‍රණයක් FIEO සමඟින් ඇරඹීමටද යෝජනා කළේය.**

*******

**කොළඹ**

**ශක වර්ෂ 1942 ජ්‍යෙෂ්ඨ 2**

**2020 මැයි 23**